## තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2017

-----------------------------------------------------------------------

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 50 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ 10(ඇ) (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2 මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය ව්‍යාචනය

-----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

#### (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී වර්ෂයේ මෙහෙයුම් ලාභය තුල ඇතුළත් නොවූ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය තුල ගැලපුම් කර තිබූ පෙර වර්ෂ ගැලපුම් හා ආරම්භක ශේෂ වෙනස්වීම් රු.1,352,722 ක් මෙහෙයුම් ලාභයට එකතුකර දක්වා තිබූ අතර රු.3,764,893 ක් අධි/ඌන වෙන් කිරීම් ගැලපුම් ලෙස අඩුකර දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට අදාලව විලම්භිත ආදායම් ලෙස රු.10,287,724 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබූ නමුත් මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී රු.312,225 ක් පමණක් ලාභයට ගැලපීම් කර තිබුණි.

(iii) ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා ලබා දී තිබූ භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන රු.9,627,424 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒම් ලෙස දක්වා නොතිබුණි.

#### (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයෙහි 14 ඡේදය ප්‍රකාරව වත්කම් අයිතමයක හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් අස්ථිත්වය වෙත ගලා ඒමේ හව්‍යතාවක් ඇති විට වත්කම් ලෙස ගිණුම්ගත කලයුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස අටවන මහලේ සංවර්ධන කටයුතු සඳහා 2016 සහ 2017 වර්ෂවලදී වැය කර තිබූ පිළිවෙලින් රු.1,315,075 ක් හා රු.8,454,616 ක් පුනරාවර්තන වියදම් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබුණි. ඒ අනුව, 2016 වර්ෂයේ ඌනතාවය රු.1,315,075 කින් අධිගණනය වී තිබූ අතර 2017 වර්ෂයේ අතිරික්තය රු.8,454,616 කින් ඌනගණනය වී තිබුණි.

(ii) මූල්‍ය අංශයේ කාර්යාල පරිශ්‍රය බෙදා වෙන්කිරීම (Partition) වෙනුවෙන් දරන ලද රු.194,500 ක මුදල ප්‍රාග්ධනිත නොකර ගොඩනැගිලි පුනරුත්ථාපන වියදම් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 5.2 අනුව, වත්කම්වලට අදාල ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් විලම්භිත ආදායම් ලෙස හඳුනාගන්නා බව දක්වා තිබුණද වර්ෂය තුල ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන රු.9,627,424 ක් වුවද එය රු.9,975,499 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව භාවිතා කළ 'තිබස්' ගිණුම්කරණ පැකේජය 2017 මැයි 09 දින සිට අක්‍රීයව තිබූ බැවින් නව ගිණුම්කරණ පැකේජයක් භාවිතා කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. එහිදී පැරණි පැකේජය තුලින් 2017 මාර්තු 31 දිනෙන් අවසන් මාස 03 සඳහා ලබාගන්නා ලද ශේෂ පිරික්සුමේ ශේෂ 2017 අප්‍රේල් 01 දිනට ආරම්භක ශේෂ ලෙස නව පැකේජයට ඇතුළත් කර ලබා ගන්නා ලද 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශේෂ පිරික්සුමක් ඇසුරෙන් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. එහෙත් 2017 මුල් මාස 03 හි ශේෂ, 2017 අප්‍රේල් 01 දිනට ඉදිරියට ගෙන ඒමේදී පහත වෙනස්කම් නිරීක්‍ෂණය විය. මෙම වැරදි ගිණුම් තැබීම් 2017 අප්‍රේල් 01 දිනෙන් පසු ජර්නල් සටහන් මගින් නිවැරදි කර නොතිබූ බැවින් එමගින් මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණාත්මක බලපෑමක් සිදු නොවුනේය යන්න විගණනයේදී බැහැර කිරීමට නොහැකි විය.

(i) මුල් මාස තුනේ ලෙජර් ගිණුම් 52 ක අවසාන හර ශේෂ හා ලෙජර් ගිණුම් 31 ක අවසාන බැර ශේෂ 2017 අප්‍රේල් 01 දිනට එම ලෙජර් ගිණුම්වල ආරම්භක හර හා බැර ශේෂ අතර පිළිවෙලින් රු.5,443,442 ක හා රු. 1,893,230 ක වෙනස්කම් පැවතීම.

(ii) මුල් මාස තුනට අදාල ශේෂ පිරික්සුමෙහි ඇතුළත් එකතුව රු.11,960,433 ක් වූ හර ශේෂ 67 ක් හා එකතුව රු.7,920,373 ක් වූ බැර ශේෂ 25 ක් 2017 අප්‍රේල් 01 දිනට වූ ශේෂ පිරික්සුමට ඇතුළත් කර නොතිබීම.

(iii) මුල් මාස තුනේ ශේෂ පිරික්සුමට ඇතුළත් නොවූ එකතුව රු.14,718,451 ක් වූ හර ශේෂ 15 ක් හා එකතුව රු.3,434,717 ක බැර ශේෂ 10 ක් 2017 අප්‍රේල් 01 දිනට වූ ශේෂ පිරික්සුමට ඇතුළත් කර තිබීම.

(ආ) මාරුකිරීමේ ගැලපුම් ගිණුම (Transfer for Adjustment Account) නමින් වූ අවිනිශ්චිත ගිණුමක අවස්ථා 17 කට අදාලව රු.1,086,305 ක් වූ හඳුනානොගත් ලැබීම් හා අවස්ථා 71 කට අදාලව රු.4,279,131 ක් වූ හඳුනානොගත් ගෙවීම් සටහන්කර එම ගිණුමේ ශේෂය වූ රු.3,192,826 ක හර ශේෂය ආදායම් ප්‍රකාශනයේ ගිවිසුම්ගත සේවා (Contractual Services) යටතේ වියදමක් ලෙස දක්වා තිබුණි. මෙම ලැබීම් හා ගෙවීම්වලට අදාල ලැබීම් කුවිතාන්සි, බිල්පත්, වවුචර් ආදී සාක්‍ෂි විගණනයට ඉදිරිපත් නොවීම සහ එම ගනුදෙනු පිළිබඳව කරන ලද නියැදි පරීක්‍ෂාවකදී අනාවරණය වූ පහත කරුණු හේතුවෙන් ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කර ඇති බවට විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(i) අංක 240113 සිට 240119 දක්වා වූ වවුචර්වල සඳහන් වියදම්වල එකතුව රු.78,990 ක් වුවද ඒ සඳහා නිකුත් කර තිබූ චෙක්පතෙහි වටිනාකම සඳහා බැංකු ප්‍රකාශනය සහ මුදල් පොත අනුව රු.92,500 ක් ගෙවා තිබූ අතර වෙනස වූ රු.13,510 ක වටිනාකමට අදාළ වියදම හඳුනා ගැනීමකින් තොරව ඉහත අවිනිශ්චිත ගිණුමට හර කර තිබීම.

(ii) කුවිතාන්සි අංක 259919 මගින් ලැබුණු රු.159,950 ක මුදල, භාණ්ඩාගාර ප්‍රදාන මුදල් පොතේ දෙවරක් සටහන් කර තිබූ අතර සාවද්‍ය ලෙස ඉහත මාරු කිරීමේ ගිණුමට බැර කර තිබීම.

(iii) චෙක්පත් 05 ක් මගින් විවිධ ණයහිමියන් හා වියදම් සඳහා ගෙවීම් කර තිබූ රු.273,854 ක් ව්‍යාපෘති මුදල් පොතෙහි හා භාණ්ඩාගාර ප්‍රදාන වෙනුවෙන් වූ මුදල් පොතේ යන මුදල් පොත් දෙකෙහිම ගෙවීම් ලෙස සටහන් කර මාරු කිරීමේ ගිණුමට හර කර තිබීම.

(ඈ) 2016 වර්ෂයේ ණයහිමියන් හා ස්ථාවර වත්කම් ලෙස ගිණුම්වලට ඇතුළත් කර තිබූ වටිනාකම රු.312,500 ක් වූ පරිගණක හා උපාංග විගණිත අවස්ථාව වූ 2018 ඔක්තෝබර් මාසය වන විටත් කොමිෂන් සභාව වෙත ලැබී නොතිබුණි. ඒ හේතුවෙන් ස්ථාවර වත්කම් හා ණයහිමියන් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබූ අතර ආයතනයේ නොමැති වත්කමක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.103,125 ක ක්‍ෂය ප්‍රතිපාදන සලසා තිබීමෙන් වර්ෂයේ අතිරික්තය ඌනගණනය වී තිබූ අතර ක්‍ෂය වෙන්කිරීම් අධිගණනය වී තිබුණි.

(ඇ) විගණනයේදී සිදු කළ ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික වියදම රු.3,122,471 ක් වුවද එය රු.1,752,096 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ අතිරික්තය සහ පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු.1,370,375 කින් පිළිවෙලින් අධි සහ ඌන ගණනය වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල රු.114,000 ක පර්යේෂණ පොත් (Research Book) මුද්‍රණ වියදම් පෙර වර්ෂ ගැලපුම් ගිණුමට ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වසරේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ වටිනාකම රු.3,705,040 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 05 ක් මිලදීගත් දින පදනම් කරගෙන ක්ෂය නොකිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.373,411 කින් වැඩියෙන් දක්වා තිබූ අතර වසරේ අතිරික්තය හා දේපළ පිරියත උපකරණවල ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද 2016 වර්ෂයට අදාල රු.1,044,593 ක වියදම් පෙර වර්ෂ ගැලපුම් ගිණුමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට ගලපා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාල ගෙවීම් ප්‍රේෂණ පත් අනුව සේවක අර්ථසාධක සඳහා සියයට 12 ක් වූ ආයතනයේ දායකය රු.5,907,230 ක් වුවද සේවක අර්ථසාධක අරමුදල් ගිණුමට අනුව එය රු.7,501,011 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම රු.1,593,781 කින් අධිගණනය වී තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාල සේවක භාරකාර අරමුදල් දායක ගෙවීම් රු.1,475,814 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.1,356,698 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ වියදම රු.119,116 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් රු.122,086 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඒ) 2017 දෙසැම්බර් මාසයේ වැටුපෙන් අයකරගෙන තිබූ රු.162,612 ක ආපදා ණය වාරික, ආපදා ණය අත්තිකාරම් ගිණුමට ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ආපදා ණය අත්තිකාරම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය තුළදී අත්තිකාරම් පියවීම සඳහා යොදන ලද ජර්නල් සටහන් 22 කට අදාල රු. 395,205 ක වටිනාකම දෙවරක් ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා ලැබිය යුතු සේවක අත්තිකාරම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේදී සභාව වෙත ලැබී තිබූ රු.540,800 ක් වටිනා ලීබඩු හා සවිකිරීම් ගිණුගත කර නොතිබුණි.

(ක) 2017 අප්‍රේල් මාසය සඳහා ගෙවූ වැටුප් ගිණුම්ගත කිරීම සඳහා වූ අංක 143 දරන ජර්නල් සටහන ලෙජරයේ දෙවරක් සටහන් කිරීම නිසා වැටුප් හා වේතන රු.4,707,763 කින් සහ අදාල බැරකම් සහ ආදායම් ගිණුම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

තවද, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වැටුප් හා වේතන වියදම රු.47,807,117 ක් වුවද, විගණනයේදී සිදු කළ ගණනය කිරීම් අනුව එම වියදම රු.51,001,833 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයට අදාළ වැටුප් හා වේතන වියදම රු.3,194,716 කින් ඌනගණනය වී තිබුණි.

(ග) 2017 මැයි සිට දෙසැම්බර් මාසය දක්වා ස්ථිර කාර්යමණ්ඩලයට ගෙවන ලද වැටුප්වලට අදාල රු.1,374,087 ක වැටුප් අවකරණ, ජර්නල් සටහන් මගින් අදාල ගිණුම්වලට ගැලපුම් කර නොතිබීම හේතුවෙන් අදාල අවකරණ ගිණුම් එම වටිනාකමින් ඌනගණනය වී තිබුණි.

(ජ) 2017 ජනවාරි 01 දින ස්ථාවර වත්කම් ක්ෂය වෙන්කිරීමේ ගිණුමේ ආරම්භක ශේෂ නිවැරදි කිරීමට ජර්නල් සටහන් අංක 385 මගින් ලෙජරයට ගිණුම්ගත කරන ලද රු.775,620 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්‍ෂය ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ට) සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.23,627,595 ක් වූ ඇගයීම් ගාස්තු තුල 2015 හා 2016 වර්ෂයන් සඳහා ගෙවන ලද ගාස්තු ද ඇතුළත්ව තිබූ අතර ඒ සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. කෙසේ වුවද, නියැදි පරීක්‍ෂාවේදී 2017 ඔක්තෝබර් මාසය තුල ගෙවා තිබුණු රු.3,906,715 ක ඇගයීම් ගාස්තු තුල 2016 වර්ෂයට අදාල රු.932,965 ක් වූයෙන් ඉකුත් වර්ෂයට අදාල වියදම් සමාලෝචිත වර්ෂයට අදාලව ගිණුම්ගත කර තිබූ බව විගණනයේදී නිරීක්‍ෂණය විය.

(ඩ) 2017 මැයි මාසයට අදාල සභාපතිවරයාගේ රු.75,000 ක් වූ මාසික දීමනාව සහ රු.12,300 ක් වූ ඇගයීම් ගාස්තුව මුදල් පොතේ සහ අදාල වියදම් ගිණුම්වල තෙවරක් සටහන් කිරීම හා චෙක්පත් 12 ක් මගින් ගෙවන ලද රු.196,300 ක් වූ වියදම් මුදල් පොතේ සහ අදාල වියදම් ගිණුම්වල දෙවරක් බැගින් සටහන් කිරීම නිසා මුදල් පොතේ ශේෂය රු.370,900 කින් ඌනගණනය වී තිබූ අතර අදාල වියදම් එම ප්‍රමාණයන්ගෙන් අධිගණනය වී තිබුණි.

(න) සමාලෝචිත වර්ෂයට අදාල 2018 වර්ෂයේදී ගෙවන ලද රු.1,149,142 ක් වූ විවිධ වියදම්, සමාලෝචිත වර්ෂයට අදාලව උපචිත වියදම් ලෙස ගිණුම්ගත නොකිරීමෙන් වර්ෂයේ අතිරික්තය සහ 2017 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අධි සහ ඌනගණනය වී තිබුණි.

(ත) 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම් ශීර්ෂය යටතේ දැක්විය යුතු විලම්භිත ආදායම් ප්‍රදාන ගිණුම ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

**2.2.4** **පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ණය ගිණුම් 03 ක ශේෂය රු.8,438,717 ක් වුවත් විගණනයට ඉදිරිපත් කළ විස්තරාත්මක උපලේඛන අනුව එම ණය ශේෂවල එකතුව රු.6,431,601 ක් වූයෙන් රු.2,007,116 ක වෙනසක් විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම අනුව, ගිණුම් අයිතම 10 ක ශේෂයන්ගේ එකතුව රු.74,172,354 ක් වුවත් ලෙජරය අනුව එම ශේෂවල එකතුව රු.68,234,831ක් වූයෙන් ශේෂ පිරික්සුම හා ලෙජර් ගිණුම් අතර රු.5,937,523 ක වෙනසක් පැවතුණි.

| | ගිණුම් අයිතමය | ශේෂ පිරික්සුම අනුව වටිනාකම (රු.) | ලෙජරය අනුව වටිනාකම (රු.) |
|---|---|---|---|
| 1. | කොමිෂන් සභා ණය | 1,012,319 | 950,875 |
| 2. | කොමිෂන් සභා ණය පොළී | 39,772 | 43,491 |
| 3. | අත්තිකාරම් | 259,000 | 9,000 |
| 4. | ආපදා ණය | 6,731,598 | 7,069,548 |
| 5. | ආපදා ණය පොළී | 379,658 | 402,445 |
| 6. | උත්සව අත්තිකාරම් | 694,800 | 679,800 |
| 7. | ජාතික වෘත්තීය සුදුසුකම් පරීක්ෂණ ගාස්තු | 10,623,090 | 10,625,089 |
| 8. | බැංකු ගිණුම (PB– 12268324) | 4,208,448 | 1,219,682 |
| 9. | ආපසු ගෙවිය යුතු ප්‍රදාන(ටව් යුවර් ෆියුචර්) | 11,028,098 | 9,881,092 |
| 10. | ආපසු ගෙවිය යුතු ප්‍රදාන (ලෝක බැංකු) | 39,195,571 | 37,353,809 |
| | එකතුව | 74,172,354 | 68,234,831 |

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම අනුව ගිණුම් අයිතම 09 ක එකතුව රු.30,852,444 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.32,830,312 ක් වූයෙන් ශේෂ පිරික්සුම හා මූල්‍ය ප්‍රකාශන අතර රු.1,977,868 ක වෙනසක් විය.

| | ගිණුම් අයිතමය | මූල්‍ය ප්‍රකාශනය අනුව වටිනාකම රු. | ශේෂ පිරික්සුම අනුව වටිනාකම රු. |
|---|---|---|---|
| 1. | සමුච්චිත ක්ෂය - පරිගණක | 21,484,361 | 20,924,366 |
| 2. | සමුච්චිත ක්ෂය - කාර්යාල උපකරණ | 5,694,175 | 5,478,548 |
| 3. | වර්ෂයේ ක්ෂය - පරිගණක | 3,044,802 | 2,484,807 |
| 4. | වර්ෂයේ ක්ෂය - කාර්යාල උපකරණ | 977,267 | 761,642 |
| 5. | ඇගයීම් ගාස්තු | - | 11,500 |
| 6. | මූල්‍ය ප්‍රධාන මාරු ගිණුම | - | 6,000 |
| 7. | ගෙවිය යුතු උපයන විට බදු අයකිරීම් | - | 8,449 |
| 8. | පෙර වර්ෂ ගැලපුම් | 1,157,183 | 1,177.132 |
| 9. | ටව් යුවර් ෆියුචර් වැඩසටහන (වෙනත්) | 472,524 | - |
| | | 32,830,312 | 30,852,444 |

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව විසින් විධිමත්ව අංකනය කරන ලද සියලු ගෙවීම් වවුචර් හා වවුචර් අංකය සහිත චෙක්පත් උපපත්‍රිකා විගණනයට ඉදිරිපත් නොකෙරුණු බැවින් ඒ පිළිබඳ සාධාරණ සහ ප්‍රමාණවත් විගණනයක් සිදුකිරීමට නොහැකි විය.තවද මුදල් පොත ඇතුළු ලෙජර් ගිණුම් නිසි පරිදි පවත්වා නොගැනීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගනුදෙනු සහ ශේෂවල නිවැරදිතාවය සහ සම්පූර්ණත්වය පිළිබඳ විගණනයේදි තහවුරු කර ගත නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව බැංකු සැසඳුම් විධිමත් පරිදි පිළියෙල කර නොතිබීම හේතුවෙන් බැංකු සැසඳුම් වල නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ශේෂ තුළ ඇතුළත් 2007 වර්ෂයේ සිට පෞද්ගලික ආයතනයකින් අයවිය යුතු රු.167,895 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වසර 05 ක් ඉක්ම වූ රු.117,140 ක සේවක ණය ශේෂ 07 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි අංක 272 (1), (3) | මුදල් රෙගුලාසිය පරිදි අදාල මාසය අවසන් වී සති 6 ක් තුළ එකී මාසයට අදාල ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල ගෙවීම් වවුචර් 155 ක් විගණිත අවස්ථාව වූ 2018 ඔක්තෝබර් 15 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 341 | මුදල් රෙගුලාසි ප්‍රකාරව උපපත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 372 | කොමිෂන් සභාවේ නිළධාරීන් වෙත විවිධ කටයුතු සඳහා ලබා දී තිබූ අත්තිකාරම් පිළිබඳ අත්තිකාරම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 396 | 2017 දෙසැම්බර් 31 දිනට පැවති නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ මාස 07 සිට අවුරුදු 2 ක් දක්වා කාලයක් ඉකුත් වී තිබූ රු.1,321,122 ක් වටිනා චෙක්පත් 147 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි නියමයන් පරිදි කටයුතු කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 454 (I) | ආයතනයේ භාවිතා කරන ඉන්වෙන්ට්‍රි බඩු පිළිබඳ වාර්තා ඇතුළත් බඩු ලේඛන පොතක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ආ) | 2016 මාර්තු 31 දිනැති 05/2016 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා 2017 දෙසැම්බර් 22 දින සහ 2018 ඔක්තෝබර් 04 යන දිනවලදී භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර තිබූ නමුත් චක්‍රලේඛය ප්‍රකාරව 2018 නොවැම්බර් 10 දින වන විටත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.16,912,796 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,982 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,928,778 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමස්ත වියදම රු.3,281,150 කින් වැඩි වී තිබුණද රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.12,088,546 කින් හා මෙහෙයුම් ආදායම රු.4,658,896 කින් වැඩි වී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන ලෙස හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ රු.4,846,384 ක් වූ ඌනතාවය 2017 වර්ෂය වන විට රු.16,912,796 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැළපීමේ දී 2013 වර්ෂයේ දී රු.39,198,869 ක් වූ දායකත්වය 2017 වර්ෂය වන විට රු.87,726,750 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව හා ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

මූල්‍යාධාර ආපසු අය කර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් පෞද්ගලික පාර්ශවයකට එරෙහිව එක් නඩුවක් හා බාහිර පාර්ශවයන් විසින් කොමිෂන් සභාවට එරෙහිව එක් නඩුවක්ද, පවරා තිබූ අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

#### 4.1.1 සැලසුම් කිරීම

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 - 2018 කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාව විසින් පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම සමාලෝචිත වර්ෂයට අදාලව යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් සකස්කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන්වල ප්‍රගතිය දැක්වෙන පරිදි කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතු වුවත් කාර්යසාධන වාර්තාව ඒ අනුව සකස්කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පනත ප්‍රකාරව ජාතික වශයෙන් පිළිගත් සහතික පත්‍ර පිරිනැමීම සඳහා ක්‍රමයක් ලෙස කොමිෂම විසින් හඳුන්වා දී තිබූ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ප්‍රදාන ක්‍රමය අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම කොමිෂන් සභාවේ ප්‍රධානතම කාර්යභාරය විය. එහෙත් ඒ සඳහා කොමිසමට ප්‍රමාණවත් සම්පත් නොමැති වීම හේතුවෙන් ඇගයීම්කරුවන් පත්කිරීම, ඇගයීම් කිරීම, ඇගයීම්කරුවන්ට ගෙවීම් කිරීම හා එම සහතික නිකුත් කිරීම යන සියලු පියවරයන්හිදී ප්‍රමාදයන් සිදු වී තිබුණි. තවද NVQ සහතික පත් ප්‍රදානය කිරීමේ අධීක්ෂණ කටයුතු ඒ හේතුවෙන් ප්‍රමාණවත් පරිදි සිදු නොවන බව පහත කරුණුවලින් නිරීක්ෂණය විය.

(i) 2017 වර්ෂයේ අලුතින් රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතන 150 ක් හා පෞද්ගලික අංශයේ වෘත්තීය පුහුණු ආයතන 210 ක් ලෙස ආයතන 360 ක් ලියාපදිංචි කිරීම සඳහා ඇගයීම් කිරීමට සැලසුම්කර තිබූ නමුත් කාර්යසාධන වාර්තාව අනුව පිළිවෙලින් ආයතන 37 ක් හා 173 ක් ලෙස ආයතන 210 ක් පමණක් ඇගයීම් කර තිබුණි. ඒ අනුව ලඟා කරගෙන තිබූ සමස්ත කාර්යසාධනය සියයට 58 ක් පමණක් විය.

(ii) 2017 වර්ෂයේ රාජ්‍ය අංශය මෙහෙයවන වෘත්තීය පුහුණු පාඨමාලා 400 ක් හා පෞද්ගලික අංශය මෙහෙයවන වෘත්තීය පුහුණු පාඨමාලා 100 ක් ලෙස පාඨමාලා 500 ක් අලුතින් ප්‍රතීතනය සඳහා ඇගයීම් කිරීමට සැලසුම් කර තිබූ නමුත් කාර්යසාධන වාර්තාව අනුව පිළිවෙලින් පාඨමාලා 195 ක් හා 78 ක් ලෙස පාඨමාලා 273 ක් පමණක් ඇගයීම් කර තිබුණි. ඒ අනුව ලඟා කරගෙන තිබූ සමස්ත කාර්යසාධනය සියයට 55 ක් පමණක් විය.

(ආ) 2017 වර්ෂයේ වාර සඟරා 02 ක් මුද්‍රණය කර බෙදාහැරීම සඳහා සැලසුම්කර තිබූ නමුත් මුද්‍රණය කර බෙදාහැර තිබුණේ එක් වාර සඟරාවක් පමණක් විය.

(ඇ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදල් යටතේ සමාලෝචිත වර්ෂය තුල පුහුණු මධ්‍යස්ථාන 90 ක් සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල ස්ථාපිත කර තිබූ මධස්ථාන සංඛ්‍යාව 65 ක් පමණක් විය.

(ඈ) 2014 – 2020 සඳහා වූ ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක අනුව ඉදිකිරීම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, ලුහු ඉංජිනේරු හා නිෂ්පාදන සහ ආගන්තුක සත්කාර හා සංචාරක යන අංශ සඳහා නිපුණතා සභා 4 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පිහිටුවා තිබූ අතර ඊට අදාල පහත සඳහන් කරුණු නිරීක්‍ෂණය විය.

- (i) නිපුණතා සභා තුනක් වෙනුවෙන් 2017 වර්ෂයේ දී, රු.මිලියන 11.64 ක් වැයකර තිබුණද ඒ සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තා ඉදිරිපත් කර නොතිබීම.
- (ii) සභාවල කටයුතු අමාත්‍යාංශය හෝ නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය විසින් අධීක්ෂණය කර නොතිබීම.
- (iii) ව්‍යාපාර සැලැස්ම අනුව එම සභා ආරම්භ කළ වර්ෂයේ සිට ආදායම් ඉපයීම කළ යුතු වුවත් එබඳු ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම.
- (iv) ඇපයෙන් සීමිත සමාගම් වශයෙන් ක්‍රියාත්මක මෙම ආයතනවල වාර්ෂික ගිණුම් වාර්තා විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබීම.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය ට අයත් ගොඩනැගිල්ලේ තුන්වන මහලේ ස්ථාපිත කොමිෂන් සභාවට අතිරේක ඉඩ පහසුකම් ලබාගැනීම සඳහා එහි අටවන මහල සුදුසු පරිදි සකස් කිරීමට 2016 නොවැම්බර් 24 දින මාසයක කොන්ත්‍රාත් කාලයකට යටත්ව රු.6,575,375 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්‍ෂණය විය.

(i) අටවන මහල සංවර්ධනය කිරීමට පූර්වයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබීම සහ අටවන මහල කොමිෂන් සභාවේ කටයුතු සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා කොමිෂන් සභාව අතර විගණිත අවස්ථාව වූ 2018 සැප්තැම්බර් 07 දින වන විටත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ii) ගිවිසුම පරිදි උක්ත පළමු අධියරේ සංවර්ධන කටයුතු නියමිත කාලය තුල අවසන් කර නොතිබූ අතර දින 142 ක් ප්‍රමාද වී 2017 මැයි 23 දින කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීමද සිදුකර නොතිබූ අතර ඒ වෙනුවෙන් ප්‍රමාද ගාස්තු රු.466,856 ක් අයකරගත යුතු වුවත් රු.144,658 ක් පමණක් අයකරගෙන තිබීම.

(iii) අටවන මහල සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රථම සැලසුම අංග සම්පූර්ණ නොවීමෙන් එහි ඇතුළත් නොවූ කොටස් සංවර්ධනය කිරීම සඳහා 2017 සැප්තැම්බර් මාසයේදී නැවත ලංසු කැඳවා තිබුණි. එහෙත් ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබූ අවම ලංසුව වූ රු.6,552,695 කට කොන්ත්‍රාත්තුව නොපවරා නැවත වරක් ලංසු කැඳවීම් කර තිබූ අතර ඒ අනුව රු.7,628,324 කට දින 90 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් 29 දින පිරිනමා තිබුණි.

(iv) 2017 දෙසැම්බර් 31 දින වන විට අටවන මහල සංවර්ධනය කිරීමේ අධියරයන් දෙක සඳහා රු.9,769,691 ක් වැයකර තිබූ නමුත් කොමිෂන් සභාවේ කාර්යාල කටයුතු සඳහා භාවිතා කිරීමට සුදුසු මට්ටමක එම මහල නොපවතින බැවින් නැවත සම්පූර්ණ සංවර්ධනයක් කළ යුතු බව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යංශය (CECB) විසින් කොමිෂන් සභාව වෙත 2018 ඔක්තෝබර් 31 දින ලබා දී තිබූ වාර්තාව මගින් දක්වා තිබුණි.

(v) 2018 මාර්තු 02 දිනැති නියෝජ්‍ය අධ්‍යක්ෂගේ ලිපිය ප්‍රකාරව වැසි ජලය කාන්දු වීම හේතුවෙන් අටවෙනි මහලේ තිබූ කොමිෂන් සභාවට අයත් උපකරණ හා ලිපි ලේඛනවලට හානි වී තිබූ අතර හානිවීම් සම්බන්ධයෙන් වූ අලාභය තක්සේරු කර නොතිබූ අතර කාර්යාල මේස 02 ක් සඳහා රු.22,000 ක් පමණක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන තිබුණි.

(ආ) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත III වන පරිච්ඡේදයේ 14 (I) වගන්තිය යටතේ ලියාපදිංචි නොකර තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සැලැස්වීම සඳහා කිසිඳු ආයතනයක් පිහිටුවීම, කළමනාකරණය කිරීම, පවත්වාගෙන යාම හෝ පාලනය කිරීම නොකළ යුතු වුවද 2014 වර්ෂයේ දී කරන ලද පර්යේෂණයකට අනුව දිවයිනේ සමස්ත වෘත්තීය පුහුණු ආයතන සංඛ්‍යාව 2,701 ක් වූ අතර කොමිෂන් සභාවේ ලියාපදිංචි කර තිබූ අධ්‍යාපන ආයතන සංඛ්‍යාව 1,080 ක් හෙවත් සියයට 40 ක් පමණ විය. විධිමත් පරිදි වර්ෂ 02 කට වරක් මෙම ආයතන ලියාපදිංචිය අලුත් නොකිරීම නිසා විගණිත අවස්ථාව වූ 2017 ඔක්තෝබර් 01 දින වන විට ලියාපදිංචි ආයතන සංඛ්‍යාව 692 දක්වා අඩු වී තිබුණි. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පිළිතුර අනුව පනතේ ප්‍රතිපාදන නොමැති වීම නිසා ලියාපදිංචිය නොලැබූ සහ අලුත් නොකරන ලද පුහුණු ආයතනවලට එරෙහිව නීතිමය පියවර ගැනීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි.

(ඇ) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ III වන පරිච්ඡේදයේ 15 (I) වගන්තිය යටතේ ලියාපදිංචි නොකර යම් තෘතීයික හා/හෝ වෘත්තීය අධ්‍යාපනය සඳහා වන නිශ්චිත පාඨමාලා නොපවැත්විය යුතු වුවද 2014 වර්ෂයේ දී කරන ලද පර්යේෂණයකට අනුව කොමිෂන් සභාවේ ජාතික නිපුණතා සුදුසුකම් මට්ටම් සඳහා ලියාපදිංචි කරගෙන තිබූ පාඨමාලා සංඛ්‍යාව 2,442 ක් විය. විධිමත් පරිදි වර්ෂ 02 කට වරක් පාඨමාලා ලියාපදිංචිය අලුත් නොකිරීම නිසා විගණිත අවස්ථාව වූ 2017 ඔක්තෝබර් 01 දින වන විට ලියාපදිංචි පාඨමාලා සංඛ්‍යාව 1,625 ක් දක්වා අඩු වී තිබූ අතර සියලු පුහුණු ආයතන හා පාඨමාලා ලියාපදිංචි කරගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් ආයතනය විසින් අනුගමනය කර නොතිබීම මේ සඳහා හේතු වී තිබුණි.

(ඈ) පනත යටතේ සාදන ලද නියෝග හෝ රීති, පුහුණු ආයතන හා පුහුණුවන්නන් විසින් පිළිපදින බව ආයතනික පරීක්ෂාව තුළින් තහවුරු කරගැනීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් කොමිෂන් සභාව සතු නොවුවද පනතේ 50 සහ 51 වගන්ති මගින් එම කටයුතු ඉටු කිරීම සඳහා මෙම පනත යටතේ සංස්ථාපිත කර ඇති ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියට පරීක්ෂකවරුන් බඳවාගෙන තිබුණද ඔවුන් ලවා හෝ එම පරීක්ෂණ කටයුතු සිදු කරවා ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඉ) ආයතනයේ පරිගණක පද්ධතිය 2017 මැයි 09 දින වන විට ක්‍රියාවිරහිත වීම සහ ඊට අදාල දත්ත ගබඩාකර (Back-ups) තබා නොගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඊට වගකිව යුතු පාර්ශව හඳුනාගැනීමට සභාව විසින් විගණිත අවස්ථාව වූ 2018 සැප්තැම්බර් වන විටත් ක්‍රියාකර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ ලියාපදිංචි කළ ආයතන විසින් දැනට පවත්වාගෙන යන පාඨමාලා, නිපුණතා සම්මත පාඨමාලා ලෙස වැඩිදියුණු කිරීම සඳහා කොමිෂන් සභාව මඟින් මූල්‍යාධාර ලබාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2017 වර්ෂයේදී රාජ්‍ය අංශයේ ආයතන 03 කට අයත් මධ්‍යස්ථාන 104 ක් විසින් මූල්‍යාධාර ලබාගැනීම සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කර තිබුණි. ඒ අතුරින් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මධ්‍යස්ථාන 03 ක පාඨමාලා 06 ක් සඳහා පමණක් උපකරණ අයිතම 382 ක් ලබාදීම සඳහා ඇගයීම්කර නිර්දේශද ලබාදී තිබුණි. එහෙත් වර්ෂය තුල කිසිදු රජයේ හෝ පීඩාවට පත් වූ අංශයන් සඳහා මූල්‍යාධාර පිරිනමා නොතිබුණි.

(ii) 2017 වර්ෂයේ පාඨමාලා සංවර්ධනය සඳහා මූල්‍යාධාර ලබාගැනීමට පෞද්ගලික ආයතන 52 කින් අයදුම්පත්‍ර ඉදිරිපත් කර තිබූ නමුත් ඉන් එක් වෘත්තීය පුහුණු ආයතනයකට පමණක් රු.2,686,526 ක මූල්‍යාධාර ලබාදී තිබුණි.

(iii) රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තීය පුහුණු ආයතන වෙත මූල්‍යාධාර සැපයීමේ අරමුණ වන්නේ හඳුනාගත් පාඨමාලා ජාතික නිපුණතා සම්මත අනුව ප්‍රතීතනය කර ඒවා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමට ගෙන ඒම විය. එහෙත් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පාඨමාලා 18 කට අදාලව රු.3,285,890 ක් මූල්‍යාධාර වශයෙන් ලබාදී තිබුණද එම පුහුණු පාඨමාලාවලින් කිසිවක් විගණිත අවස්ථාව වූ 2018 ඔක්තෝබර් 05 දින වන විටත් ප්‍රතීතනය කර නොතිබුණි.

(iv) 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පාඨමාලා ප්‍රතීතනයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත කොමිෂන් සභාව විසින් මූල්‍යාධාර ලෙස ලබාදී තිබූ රු.10,427,342 ක් එම අරමුණට භාවිතා නොකර 2017 දෙසැම්බර් 31 දින වන විටත් වෘත්තීය පුහුණු අධිකාරියේ ගිණුම්වල නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) පාඨමාලා පවත්වාගෙන යන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල තත්ත්ව සහතිකකරණ අවශ්‍යතා සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම කොමිෂන් සභාව වෙත පැවරී තිබූ අතර ඒ සඳහා රු. මිලියන 04 ක් 2017 වර්ෂය තුල වැය කර තිබුණි. මේ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අභ්‍යන්තර නිලධාරින් 20 ක් හා බාහිර නිලධාරින් 13 ක් ඇතුලු තත්ත්ව කළමනාකරණ විගණකයින් 33 දෙනෙකු ප්‍රධාන විගණකයින් ලෙස පුහුණු කර තිබුණි. එහෙත් බාහිර නිලධාරීන් විගණකයින් ලෙස බඳවා ගැනීමේදී අවශ්‍ය සුදුසුකම් ඇතුලු පිළිගත හැකි නිර්ණායක හඳුනාගෙන නොතිබූ අතර ඉන් නිලධාරීන් 10 දෙනෙක් කිසිදු විගණන කටයුත්තක යෙදී නොතිබුණි.

(ii) අභ්‍යන්තර නිලධාරීන් අතුරින් 06 දෙනෙකු 27 සිට 35 දක්වා වාර ගණනක් විගණන කටයුතු සිදුකරන විට 14 දෙනකු 1 ත් 16 ත් අතර වාර ගණනක් විගණන කටයුතු සිදුකර තිබීම හා බාහිර නිලධාරීන් අභ්‍යන්තර නිලධාරීන්ට සාපේක්ෂව අඩුවෙන් විගණන කටයුතු සඳහා යොදවාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(iii) 2017 වර්ෂයේදී වෘත්තිය පුහුණු අධිකාරිය හා ජාතික ආධුනිකත්ව පුහුණු කිරීම් අධිකාරිය විසින් මෙම ක්‍රමයට ඇතුළත්වීම සඳහා රු.මිලියන 25.83 ක් වැයකර පෙර සූදානම්වීම් සිදුකර තිබූ නමුත් එම මධ්‍යස්ථාන කොමිෂන් සභාව විසින් විගණනය කර නොතිබුණි.

(iv) තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සහ එම පද්ධති විගණනය සඳහා ආයතන තෝරා ගැනීම, විගණන නිලධාරීන් පත්කිරීම යනාදී කටයුතු විනිවිදභාවයකින් සිදුවන බවට තහවුරු කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

(v) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කොමිෂන් සභාවේ තීරණ අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වර්ෂ 03 ඇතුළතදී තත්ත්ව සහතිකකරණ ගාස්තු රු.50,000, රු.25,000 හා රු.7,500 ලෙස අවස්ථා 03 කදී වෙනස් කර තිබුණි.

(vi) තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපනය සඳහා විගණන කටයුතුවල යොදාගන්නා ලද අභ්‍යන්තර නිලධාරීන් වෙත ප්‍රවාහන දීමනා, නවාතැන් දීමනා හා පෙරදින දීමනා වශයෙන් පිළිවෙලින් දිනකට රු.3,500, රු.2,000 සහ රු.500 බැගින් ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 4.5 ඡේදයට පටහැනිව ගෙවා තිබූ අතර භාණ්ඩාගාර අනුමැතියක්ද මේ සඳහා ලබාගෙන නොතිබුණි.

## 4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

කොමිෂන් සභාවට අයත් පිරිවැය රු.2,150,000 ක මෝටර් රථයක් 2017 සැප්තැම්බර් 18 දින සිට ක්‍රියාවිරහිතව තිබූ නමුත් අලුත්වැඩියා කිරීමකින් තොරව විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 25 දින වන විටත් නිශ්ක්‍රීයව පැවතුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ අනුමත කාර්යමණ්ඩලය 116 ක් වුවද තථ්‍යකාර්ය මණ්ඩලය 96 ක් විය. ඒ අතර අත්‍යාවශ්‍ය තනතුරු වන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර, අධ්‍යක්ෂ තනතුරු 02 ක් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 04 ක් ද පැවතුණි.

(ආ) ආයතනය සඳහා නිලධාරීන් බඳවාගැනීමේ නියමිත ක්‍රමවේදයට පරිබාහිරව අනුමත කාර්ය මණ්ඩලය තුල නොවූ සම්බන්ධතා ප්‍රතිසංස්කරණ සහ පුහුණු සංවර්ධන තනතුර සඳහා මාණ්ඩලික පත්‍රිකා අංක 218/18 මගින් අනුමැතිය ලබාගෙන තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් පදනමින් 2017 ඔක්තෝබර් 01 ත් 2018 ඔක්තෝබර් 21 ත් අතර කෙටි කාලය තුල අවස්ථා කිහිපයකදී නිලධාරීන් තිදෙනෙකු බඳවාගෙන ඒ වෙනුවෙන් රු.714,665 ක මුදලක් ගෙවා තිබුණි.

## 4.6 අරමුදල් උපයෝජනය

ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් 2012 සහ 2013 යන වර්ෂවලදී ලැබී තිබූ එකතුව රු.3,300,000 ක මුදලක් පාලක මණ්ඩල හෝ භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සහ කොමිෂන් සභාවේ අරමුණුවලට පටහැනිව ස්ථාවර තැන්පතු 03 ක ආයෝජනය කර තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය " ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පැවතියද සමාලෝචිත වර්ෂයට අදාලව කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. ඒ හේතුවෙන් තම කාර්යයන් සම්බන්ධව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලගා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ලඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් කොමිෂන් සභාවේ 2017 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන දින 190 ක ප්‍රමාදයකින් පසු 2018 සැප්තැම්බර් 07 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 05 දෙනෙකු වූ නමුත් එයින් සහකාර අධ්‍යක්ෂ තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රමාණවත් විගණනයක් සිදු වී නොතිබුණි. අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 04 දෙනෙක්ම අධීක්ෂණ මට්ටමේ වූ අතර තත්‍ය වශයෙන් වර්ෂය තුල නිලධාරීන් දෙදෙනෙකු අධීක්ෂණ මට්ටමේ සේවය කර තිබුණි.

### 6.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සියයට 20 සිට සියයට 148 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

### 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 4.4.ආ ඡේදයේ දක්වා ඇති පරිදි බඳවා ගැනීමේ පරිපාටියේ 4.1.2 වගන්තිය අනුව කළමනාකරණ සේවා ගනයෙහි තනතුරු සඳහා ඉල්ලුම් කරන අභ්‍යන්තර අයදුම්කරුවන් කනිෂ්ඨ කළමනාකරණ සේවා ගනයෙහි I ශ්‍රේණියේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළයුතුය. එහෙත් පහළ කළමනාකරණ මට්ටමේ නියමිත පරිදි සේවා පලපුරුද්ද සම්පූර්ණ නොකළ අභ්‍යන්තර නිළධාරීන් හය දෙනෙකු සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවාගෙන තිබුණි. තවද ලකුණු දීමේ පරිපාටිය හඳුනාගෙන තිබුණද අමතර සුදුසුකම් හා පලපුරුද්ද සඳහා සියළු අයදුම්කරුවන්ට සාධාරණ වන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දී නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) නව පරිගණකගත ගිණුම් පද්ධතියට 2017 වර්ෂයට අදාළ සියලු වවුචර් ඇතුලත් කර නොතිබීම.<br>(ii) 2017 මැයි මාසයේ දී පරිගණකගත ගිණුම් පද්ධතිය ක්‍රියා විරහිත වීමත් සමග විධිමත් පරිදි දත්ත පිටත ගබඩා කර නොතිබීම (Back up) නිසා පරිගණකගත දත්ත සම්පූර්ණයෙන්ම විනාශ වීම. |
| (ආ) මූල්‍ය පාලනය | (i) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මගින් ලබාදී තිබූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම.<br>(ii) බැංකු සැසඳුම් ප්‍රකාශ නිවැරදිව සකස් කර නොතිබීම. |
| (ඇ) මානව සම්පත් පරිපාලනය | ඇගයීම්කරුවන්ගේ අවශ්‍යතාවය තක්සේරු කිරීම, බඳවා ගැනීම හා ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දී නොතිබීම. |
| (ඈ) ලේඛණවල ආරක්ෂාව | විගණනය සඳහා වවුචර් ඉදිරිපත් කිරීමේදී හිඟ වවුචර් සහිතව ඉදිරිපත් කර තිබූ අතර වගකිව යුතු නිලධාරියකු විසින් පරීක්ෂා කර නොතිබීම, වවුචර් ආරක්ෂා කර ගැනීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබීම. |